**මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය - 2021**

--------------------------------------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

---------------

1.1 තත්ත්වාගණනය කළ මතය

------------------------------

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව, මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

--------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

---------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති,

පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිත කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 7 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීව කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දින වන විට සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු පිරිවැය රු.10,019,769 ක් වූ කාර්යාලීය උපකරණ 14 ක් හා පිරිවැය රු.2,093,728 ක් වූ මල්ටිමීඩියා ප්‍රොජෙක්ටරය තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 3 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | 2022 වර්ෂයේ සිට ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 3 අනුව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීව කාලය වාර්ෂිකව සමාලෝචනය කිරීමට හා ප්‍රතිගණනය කිරීමට කටයුතු කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පශ්චාත් උපාධි පාඨමාලා සම්පූර්ණ කිරීමට ලබාදී ඇති උපරිම කාල සීමාව තුළ ලැබෙන පාඨමාලා ගාස්තු පමණක් ආදායම් වශයෙන් හඳුනා ගැනීම ආයතනයේ ප්‍රතිපත්තිය වුවද, පාඨමාලා 09 කට අදාළව උපරිම කාල සීමාව තුළ ලැබී නොතිබුණු රු.16,800,252 ක පාඨමාලා ගාස්තු ලැබිය යුතු ආදායම් ලෙස හඳුනාගෙන තිබුණි. | උපරිම කාලසීමාව ඉක්මවා ඇති මෙතෙක් නොලැබුණු පාඨමාලා ගාස්තු වන රු.16,800,252 ක මුදලක් මූල්‍ය ප්‍රකාශනයෙන් කපා හැරීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමින් ඇති බව. | ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

1.6 ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලියාපදිංචි සිසුන්ගෙන් ලැබිය යුතු හිඟ පාඨමාලා ගාස්තු රු.73,548,307 ක් වූ අතර ඉන් රු.23,087,364 ක් වසර 05 කට වඩා වැඩි කාලයක සිට අය කර ගැනීමට අපොහොසත් වී තිබුණි. | පැවති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් සිසුන්ගේ අය කිරීම්වල ප්‍රමාදයක් පවතින බව. | ලැබිය යුතු පාඨමාලා ගාස්තු නියමිත කාල සීමාව තුළ අයකර ගත යුතුය. |

1.7 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 880 | ඇප ආඥා පනත ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් 04 දෙනෙකුගෙන් ඇප තැන්පතු ලබා ගෙන නොතිබුණි. | තැබිය යුතු ඇප තැන්පතු මුදල තීරණය කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යොමු කර ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 ඡේදය | මුදල් වර්ෂය අවසන්වී දින 150 ක් ඇතුළත විගණන වාර්තාව සමඟ පසුගිය වර්ෂයේ කාර්යසාධනය ඇතුළත් වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවද, ආයතනය විසින් ඉකුත් වර්ෂයට අදාළ වාර්ෂික වාර්තාව 2022 මාර්තු 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | 2020 වාර්ෂික වාර්තාව අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් දැනුම් දෙනු ලබන දිනයකදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට සූදානම්ව පවතින බව. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.70,034,596 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.43,163,553 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයේ රු.26,871,043 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට අභ්‍යන්තර ආදායම් ඉපැයීම රු.32,314,388 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන පශ්චාත් උපාධි පාඨමාලා 58 ක් සඳහා සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | මෙම පාඨමාලා සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමට අදාළ තොරතුරු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත 2019 දෙසැම්බර් 04 දින යොමු කළ බව හා මේ වන විට අදාළ පාඨමාලාවන් සමාලෝචනය කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව ආරක්ෂණ කවුන්සිලය වෙත යොමු කර ඇති බව. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | මූලික උපාධියක් නොමැති සිසුන් සංචාරක සහ ශාස්ත්‍රපති පශ්චාත් උපාධි පාඨමාලාව සඳහා තෝරා ගැනීමේදී සුදුසුකම් ලැබීමේ විභාගයකින් සමත්විය යුතු වුවද, එවැනි විභාගයක් නොපවත්වා උපාධි අපේක්ෂකයින් 07 දෙනෙකු පාඨමාලාව සඳහා බඳවාගෙන තිබුණි. | තිරසාර සංචාරක ශාස්ත්‍රපති පශ්චාත් උපාධි පාඨමාලාව සඳහා පළමු වරට සිසුන් තෝරා ගැනීමේදී එම තෝරා ගැනීමේ ක්‍රියාවලිය තුළ අඩුපාඩු කිහිපයක් සිදුවී ඇති බව. | බඳවා ගැනීමේ පරිපාටීන්වලට අනුකූලව පශ්චාත් උපාධි පාඨමාලා සඳහා සිසුන් බඳවා ගත යුතුය. |

3.2 මෙහෙයුම් ආකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මනෝ විද්‍යාව, දර්ශනය සහ අධ්‍යාපනය (Phycology, Philosophy and Education) යන පාඨමාලා සඳහා බඳවා ගෙන තිබුණු ශිෂ්‍ය සංඛ්‍යාව 2019 වර්ෂයට සාපේක්ෂව ඉකුත් වර්ෂයේදී සියයට 64 කින්ද සමාලෝචිත වර්ෂයේදී සියයට 69 කින්ද අඩුවී තිබුණි. එමෙන්ම විදේශීය ශිෂ්‍යයින් බඳවා ගැනීමද 2019 වර්ෂයට සාපේක්ෂව, ඉකුත් වර්ෂයේදී සියයට 55 කින් හා සමාලෝචිත වර්ෂයේදී සියයට 58 කින් අඩුවී තිබුණි. | පැවති කොවිඩ් 19 තත්ත්වය මත අදාළ සිසුන්ගේ පාඨමාලා කාලය දීර්ඝ කිරීමට සිදුවීම හේතුවෙන් 2021 වර්ෂය තුළදී අදාළ පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමට නොහැකිවීම හා විදේශීය සිසුන් ආයතනයේ පශ්චාත් උපාධි පාඨමාලාවන් සඳහා ලියාපදිංචිවීම ඉතා අවම මට්ටමක පැවති බව. | තාත්වික වාර්ෂික ක්‍රියාකාරී සැලැසුම් පිළියෙල කර එම සැලැසුම්වලට අනුව කටයුතු කළ යුතුය. |

## 3.3 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රංශ ආධාර යටතේ ක්‍රියාත්මක සෙඩ්රික් (SEDRIC) ව්‍යාපෘතිය සඳහා ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී රු.9,444,126 ක් ලැබී තිබුණු නමුත් ඉන් රු.8,986,126 ක් 2021 දෙසැම්බර් 31 දින වන විටත් ඌන උපයෝජිතව පැවතුණි. | 2020 හා 2021 වර්ෂවලදී රටේ පැවති ව්‍යසනකාරි තත්ත්වය මත ක්ෂේත්‍ර වැඩසටහන් සිදු කිරීමට නොහැකිවීම නිසා එම මුදල ඌන උපයෝජිතව ඇති බව. | ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අරමුදල් අදාළ කාර්යයන් සඳහා ප්‍රශස්ත හා කාර්යයක්ෂම අයුරින් උපයෝජනය කළ යුතුය. |
| (ආ) | විදේශීය සිසුන් සඳහා නවාතැන් පහසුකම් ලබාදීමට ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීම සඳහා චීනයේ මිනාන් බෞද්ධ විද්‍යාලයෙන් 2017, 2018 සහ 2019 වර්ෂවලදී ප්‍රදාන වශයෙන් ලැබී තිබුණු රු.6,699,195 ක් ඒ සඳහා උපයෝජනය නොකර ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. | ආයතනය විසින් මෙම මුදල් ශිෂ්‍ය නේවාසික ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ කටයුතු ආරම්භ කිරීම සඳහා යොදා ගැනීමට තීරණය කළ බව හා ගොඩනැගිල්ල ඉදිකිරීමේ මූලික වැඩ කටයුතු සකස් කරන තෙක් එම මුදල් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කළ බව. | -එම- |

## 3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොන්ත්‍රාත් වටිනාකම රු.4,666,843 ක් වූ ආයතනයේ පිවිසුම් මාර්ගය පුළුල් කිරීමට සහ වාහන නවතා තැබීමට ගරාජයක් හා පැති බැම්මක් ඉදිකිරීමේ කොන්ත්‍රාත් ගිවිසුමට අනුව 2019 මැයි මස 27 වන දින වන විට වැඩ අවසන් කළ යුතුව තිබුණු නමුත් 2021 දෙසැම්බර් 31 දින වන විටත් වැඩ අවසන් කර නොතිබුණි. | අමතර වැඩ කටයුතු වෙනුවෙන් ගෙවීම් අනුමත කිරීම, මුදල් ගෙවීම ප්‍රමාදවීම හා 2020 වර්ෂය තුළ රටේ පැවති අයහපත් වාතාවරණය නිසා මෙම වැඩ කටයුතු නියමිත දිනට අවසන් කිරීමට නොහැකි වූ බව. | ගිවිසුම්ගත කාල සීමාව තුළ කොන්ත්‍රාත් කටයුතු නිම කරවා ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සේවා අවශ්‍යතාවය මත අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කර ගැනීමකින් තොරව අනුමත සේවක සංඛ්‍යාව තුළ නොවූ තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම මත සේවකයින් 16 දෙනෙකු බඳවා ගෙන සමාලෝචිත වර්ෂය තුළ වැටුප් හා දීමනා ලෙස රු.7,263,351 ක් ගෙවා තිබුණි. | තනතුරු අනුමතවීමෙන් පසු එම තනතුරු සඳහා ස්ථිර කාර්යය මණ්ඩලය බඳවා ගන්නා තෙක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 2016/04 අනුව ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය සහිතව ඉහත සේවකයන් කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා ඇති බව. | අවශ්‍යතාවය අනුව අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කර ගෙන ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය. |